මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

# පහත සඳහන් මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන් වෙත කෙරෙන නිවේදනයයි

- **බලපත්‍රලාභී වාණිජ බැංකු/බලපත්‍රලාභී විශේෂ බැංකු/බලපත්‍රලාභී මුදල් සමාගම්**
- **කොටස් තැරව්කාර සමාගම්**
- **මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරුකිරීමේ සේවා සපයන්නන් (උදා: ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්, මුදල් ප්‍රේෂණය කිරීමේ සේවා සපයන්නන්)**

ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීම යනුවෙන් පොදුවේ හඳුන්වනු ලබන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ (Customer Due Diligence) ක්‍රියාවලියේදී ගනුදෙනුකරු විසින් තමා සහ තමාගේ ගනුදෙනු පිළිබඳ තොරතුරු බැංකුවට හෝ වෙනත් මූල්‍ය ආයතනයකට ලබාදීම සිදු කරයි. ශ්‍රී ලංකාවේ පවතින මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ නීති හා රෙගුලාසි* අනුව මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන් සමග ව්‍යාපාරික සබඳතාවයන් ඇරඹීමට පෙර ගනුදෙනුකරු හඳුනාගැනීම කළ යුතු වේ. එසේම අපරාධකරුවන්/ත්‍රස්තවාදයට අරමුදල් සපයන්නන් විසින් මූල්‍ය පද්ධතිය අවභාවිතා කිරීම වැළැක්වීම සඳහා ගනුදෙනුකරුවන්ගේ තොරතුරු නිරතුරුව යාවත්කාලීන හා සමාලෝචනය කිරීම ද අවශ්‍ය වේ.

ගනුදෙනුකරුවන් විසින් අවම වශයෙන් පහත තොරතුරු මූල්‍ය ආයතන වෙත ලබාදිය යුතුය.

| | |
|---|---|
| සම්පූර්ණ නම | ව්‍යාපාර කටයුතු පිළිබඳ තොරතුරු හෝ සේවායෝජකයාගේ තොරතුරු |
| උපන් දිනය, ජාතිකත්වය | අපේක්ෂිත මාසික ආදායම |
| නිල පෞද්ගලික හැඳුනුම්පත හෝ ගනුදෙනුකරුගේ හෝ ප්‍රතිලාභී හිමිකරුගේ ඡායාරූපයක් ඇතුලත්වන හඳුනාගැනීමේ ලේඛනයන් (උදා:- ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය, වලංගු රියදුරු බලපත්‍රය) | අපේක්ෂිත ගනුදෙනු ක්‍රම (උදා:- මුදල්, චෙක්පත් යනාදිය) |
| ලිපිනය | ආදායම් මූලාශ්‍ර |
| ගිණුම විවෘත කිරීමේ අරමුණ | ප්‍රතිලාභී හිමිකරුවන්ගේ තොරතුරු හා දේශපාලනික වශයෙන් අනාවරණය වූ තැනැත්තන් පිළිබඳ තත්ත්වය (අවශ්‍ය අවස්ථාවලදී) |
| අවශ්‍ය අවස්ථාවන්හි දී ගනුදෙනුකරු පිළිබඳ විමසිලිමත්වීම සඳහා අඛණ්ඩ හා වැඩිදුර නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය අමතර තොරතුරු | |

අවම වශයෙන් ලබාදිය යුතු තොරතුරු ගනුදෙනුකරුගේ ස්වභාවය (උදා: තනිපුද්ගල, සමූහ, හවුල් ව්‍යාපාර, පුණ්‍යායතන) මත වෙනස් හැකිය.

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීම උදෙසා ගෝලීය වශයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම ජාත්‍යන්තර මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් සිදුකරනු ලබයි. මෙම කාර්ය සාධක බලකාය මගින් රටවල් විසින් අනුගමනය කල යුතු ගනුදෙනුකරු හඳුනාගැනීමේ අවශ්‍යතාද ඇතුලුව නිර්දේශ 40 ක් නිකුත් කර තිබේ. මේ අනුව, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම හා මුදල් වශුද්ධිකරණය වැළැක්වීම සඳහා ප්‍රධාන ආයතනය ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් රීති නිකුත් කරනු ලබයි.**

මූල්‍ය ආයතනයන් හි ගනුදෙනුකරුවන්ගේ හඳුනාගැනීම සහ ඔවුන්ගේ අනෙකුත් මූලික තොරතුරු විස්තර ලබා ගැනීම අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති ක්‍රමවේදයකි. එබැවින්, මේ සම්බන්ධයෙන් සියලුම මූල්‍ය ආයතනයන්හි ගනුදෙනුකරුවන්ගේ සහාය අපේක්ෂා කෙරේ.

*2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති

වැඩිදුර තොරතුරු සඳහා අමතන්න

අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය,
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

011-2477509 011-2477692 dfiu@cbsl.lk www.fiusrilanka.gov.lk